ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නි**වේදනය**

**<u>13 වන Admiral's Cup රුවල් යාත්‍රා තරඟාවලිය ඉන්දීය නාවික හමුදා ඇකඩමියේදී ඇරඹේ</u>**

13 වන වාර්ෂික Admiral's Cup රුවල් යාත්‍රා තරඟාවලිය 2024 දෙසැම්බර් 08 වන දින කේරළයේ එසිමාලා හි ඉන්දීය නාවික හමුදා ඇකඩමියේදී ආරම්භ විය. ත්‍රිකුණාමලය නාවික සහ සමුද්‍රීය ඇකඩමියේ නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තරඟාවලිය සඳහා සහභාගී වේ. ලොව පුරා රටවල් 25ක් සහභාගී වන මෙම තරඟාවලිය දින හයක් පුරා පැවැත්වෙනු ඇත.

2. ශ්‍රී ලංකාව මෙයට පෙර ද මෙම තරඟාවලිය සඳහා සහභාගී වී ඇති අතර ඉන්දීය නාවික හමුදා ඇකඩමියේ කණ්ඩායමක් ද සෑම වසරකම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ත්‍රිකුණාමලයේදී පවත්වනු ලබන Commandant's Cup රුවල් යාත්‍රා තරඟාවලිය සඳහා සහභාගී වේ. මෙම වසරේදී ඉන්දීය කණ්ඩායම විසින් තරඟාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී.

3. ඉන්දීය නාවික හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර සමීප සහෝදරත්වය සෑම සහයෝගීතා ක්ෂේත්‍රයකම දක්නට ලැබේ. මීළඟ සතියේදී ඉන්දීය නාවික හමුදා සහ ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවන් වාර්ෂික SLINEX අභ්‍යාසය ඉන්දියාවේ විශාඛාපට්නම් හිදී සහ ඒ අසල මුහුදේදී සිදු කරනු ඇත. මෙයට සමගාමීව දෙරටෙහි නාවික හමුදාවන් අන්‍යෝන්‍ය පුහුණු අවස්ථා, මෙහෙයුම් සහ බුද්ධි තොරතුරු බෙදා ගැනීම ඇතුළු සියලු ද්විපාර්ශ්වීය සහයෝගීතා ක්ෂේත්‍රයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දෙසැම්බර් 18-20 දිනවල නව දිල්ලියේදී වාර්ෂික කාර්ය මණ්ඩල සාකච්ඡාවන් පවත්වනු ඇත.

4. දෙරටෙහි හමුදාවන්ගේ ඒකාබද්ධ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෑතකදී අරාබි මුහුදේදී නීතිවිරෝධී මත්ද්‍රව්‍ය විශාල තොගයක් අත්අඩංගුවට ගන්නා ලදී. මේ සඳහා යුධ නෞකා, සමුද්‍රීය මුරසංචාර ගුවන්යානා, මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන්යානා යෙදවූ අතර දෙරටෙහි නාවික හමුදාවන් අතර ඵලදායි අයුරින් බුද්ධි තොරතුරු හුවමාරු කරගන්නා ලදී. මාලදිවයින ද සමඟ සමීප සම්බන්ධීකරණයකින් සිදු කරන මෙවැනි මෙහෙයුම් කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව සහතික කරමින් මුහුද ඔස්සේ දේශසීමා හරහා එල්ලවන තර්ජනයන් සාර්ථකව මැඩ පවත්වයි. මෙය කොළඹ ආරක්ෂක පර්ෂද ප්‍රඥප්තියේ ද ප්‍රධාන කුළුණක් වන අතර කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන අග්‍රාමාත්‍යතුමාගේ දැක්ම සමඟ ද සමපාත වේ.

***

**කොළඹ**
***2024** දෙසැම්බර් **12***